# සාමාන්‍ය සමයේ දසසතරවන සතිය
# බදාදා

## පළමුවන කියැවීම

උත්පත්ති පොතෙන් ගත් පාඨයෙකි.

උත්පත්ති 41: 55-57, 42: 5-7, 17-24

"අපේ සොහොයුරාට අප කළ දේ දැන් පල දේ."

මුළු මිසර දේශයම සාගතයෙන් පෙළුණ විට, සෙනඟ ද ආහාර ද ඉල්ලා පාරාවෝට මොර ගැසූහ. පාරාවෝ ද සියලු මිසර වාසීන්ට කතා කොට, "ජෝසෙප් වෙත යන්න. ඔහු නුඹලාට කියන දෙයක් කරන්නැ"යි කීය. සාගතය ද මුළු පොළෝ තලය පුරා පැවතිණි. ජෝසෙප් ගබඩා සියල්ල විවෘත කොට මුළු මිසර වාසීන්ට ධාන්‍ය වික්කේය. මුළු මිසර දේශය තුළ සාගතය තදින් බල පැවේය. ධාන්‍ය මිලට ගැනීම සඳහා සැම රටවලින් ම සෙනඟ ජෝසෙප් වෙත මිසර දේශයට ගලා එන්නට වූහ. සැම රටකම සාගතය දරුණු ලෙස පැවතිණි.

මෙලෙස කානාන් දේශයේ ද සාගතය පැවතිණි. ධාන්‍ය මිලයට ගැනීමට ආ අය අතර ඉශ්රායෙල් පුත්‍රයෝ ද වූහ. ජෝසෙප් රටේ අධිපති වූවාක් මෙන් ම, රටේ මිනිසුන් සියල්ලන්ට ම ධාන්‍ය විකුණුයේ ද ඔහු ය. ඔහුගේ සහෝදරයෝ පැමිණ ඔහු ඉදිරියෙහි මුණින් තලා වී වැන්දාහ.

ජෝසෙප් ඔහුගේ සහෝදරයන් දැක, ඔවුන් හඳුනාගත් නමුත්, තමා නාඳ නන්නාක් මෙන් හඟවා, ඔවුන්ට තදින් කතා කරමින් "නුඹලා ආවේ කිනම් රටකින් දැ"යි ඇසීය. ආහාර මිලට ගනු පිණිස කානාන් දේශයෙන් ය"යි ඔව්හු කීහ. ඔහු ඔවුන් සියල්ලන් ම දින තුනක් හිරබාරයේ තැබීය.

තුන්වන දින ජෝසෙප් ඔවුන්ට කතා කොට, "මම දෙවියන් වහන්සේ කෙරෙහි ගරු බිය ඇත්තෙක්මි. එබැවින් නුඹලා පණ බේරාගන්නට කැමැති නම් මෙසේ කරන්න. නුඹලා අවංක අය නම් සොහොයුරන් වන නුඹලා ගෙන් කෙනෙකු මේ සිරගෙයි සිර අඩස්සියේ තබා අනෙක් අය නුඹලාගේ පවුල්වල ඇති සාගතය සඳහා ධාන්‍ය රැගෙන යන්න. එහෙත් බාල ම සහෝදරයා මා වෙත ගෙනා යුතු ය. මෙලෙස නුඹලා ඇත්ත කී බව ඔප්පු වීමෙන් මරණයෙන් බේරෙන්නහු ය"යි කීය.

ඔව්හු ද ඊට එකඟ වූහ. ඉන්පසු ඔව්හු එකිනෙකා අමතමින් "අපි ඇත්තෙන්ම අපගේ සහෝදරයාට කළ දේ ගැන වරදකරුවෝ වෙමු. ඒ මන්ද, ඔහු අපට කන්නලව් කරද්දී ඔහුගේ වේදනාව දැක දැකත් අපි ඇහුම්කන් නුදුන්නෙමු. මේ විපත අප පැමිණියේ ඒ නිසාම ය"යි කීවෝය.

එවිට රූබන් පිළිතුරු දෙමින් "ළමයාට විරුද්ධව පව් නොකරන්න" කියා මා ඔබට කීවා නොවේද? එහෙත් ඔබ ඇහුම්කන් නුදුන්නාහු ය. එබැවින් මෙන්න ඔබගේ ලේ ගැන අපි දැන් වන්දි ගෙවිය යුතු ය"යි කීය.

ඔවුන් කී දේ ජෝසෙප් තේරුම් ගත් බව ඔව්හු දැන නොගත්හ. ඔහු ඔවුන්ට කතා කළේ තෝල්කයකු මගින් බැවිනි. ඔහු ද ඔවුන්ගෙන් ඉවතට ගොස් හැඬීය.

දේව වාක්‍යය එසේය.

# පිළිතුරු ගීය

ගීතාවලිය **32: 2, 3, 10, 11, 18, 19**

පිළිතුර: සමිඳුනි, ඔබ වහන්සේගේ කරුණාව අප කෙරෙහි වේවා!

ගීය:

වීණාව වයා හිමිතුමන් පසසන්න. තත් දසයේ වීණාව ගෙන එතුමන්ට පැසසුම් ගීත ගයන්න. එතුමන්ට නව ගීතයක් ගයන්න. මහ හඬකින් දක්ෂ ලෙස වාදනය කරන්න.

හිමිතුමාණෝ ජාතීන්ගේ සැලසුම් නිෂ්ප්‍රභා කරන සේක. මනුෂ්‍ය ජාතීන්ගේ සිතුවිලි ව්‍යර්ථ කරන සේක.
එහෙත් සමිඳුන්ගේ සැලසුම් සදහට ම ද එතුමන්ගේ සිතුවිලි පරපුරෙන් පරපුරට ද පවත්නේය.

දේව භය ඇත්තෙනි, දේව කරුණාව පතන්න. මරණයෙන් ගළවන පිණිස ද දුබික් දුරු කොට දිවි රක්නා පිණිස ද එතුමාණෝ දිවැසින් බලන සේක.

## සාධුකාරය (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!

තමන් වහන්සේ මැවූ සියල්ලන් අතර කුළුඳුලන් වන පිණිස ස්වකීය සත්‍ය වචනයෙන් ස්වාමින් වහන්සේ අප ජනිත කළ සේක.

ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!

දෙවියන් වහන්සේගේ රාජ්‍යය ආසන්න ය.

මනස්ථාපනය වන්න. සුබ අස්න ද අදහා ගන්න.

ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 10: 1-7

"ඉශ්රායෙල් වංශයේ නැති වූ බැටළුවන් වෙතට යන්න."

ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් දොළොස් දෙනා තමන් වෙත කැඳවා, දුෂ්ටාත්මයන් දුරු කරන පිණිස ද සියලු ආකාර ලෙඩ රෝග සුව කරන පිණිස ද ඔවුන්ට බලය පවරා දුන් සේක.

ශ්‍රාවකයන් දොළොස් දෙනාගේ නම් මෙසේය. පළමුව පේදුරු නම් ලත් සීමොන් සහ ඔහුගේ සොහොයුරු ඇන්ඩෲ ය. සෙබදීගේ පුත් ජාකොබ් සහ ඔහුගේ සොහොයුරු ජුවාම් ය. පිලිප් සහ බර්තොලමේව් ය. තෝමස් සහ අයකැමියා වන මතෙව් ය. අල්පේවුස්ගේ පුත් ජාකොබ් සහ තද්දේවුස් ය. අන්ත ජාතිවාදී සීමොන් සහ උන්වහන්සේ පාවා දුන් ජූදස් ඉස්කාරියෝත් යන මොවුහු ය.

ජේසුස් වහන්සේ මෙකී දොළොස් දෙනා යවමින් ඔවුන්ට මෙසේ අණ දුන් සේක. "විජාතීන්ගේ මාවතකට පා නොතබන්න. සමාරියයන්ගේ නුවරකට ඇතුල් නොවන්න. ඉශ්රායෙල් වංශයේ නැති වූ බැටළුවන් වෙතට යන්න. එසේ ගොස් ස්වර්ග රාජ්‍යය ළංවී ඇතැයි දේශනා කරන්නැ"යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.